තලවාකැලේ ඩයගම ප්‍රදේශයේ පදිංචි තරුණියක් දිවිනසා ගැනීම ඔස්සේ මරණයට පත්වී ඇති බව මාධ්‍ය වාර්තා කිහිපයක සඳහන් වේ.

මෙම වාර්තාවන් තුළ, දිවි තොර කර ගැනීමට හේතුව සරලව දැක්වීම, දිවි තොර කර ගත් ආකාරය සඳහන් කිරීම, දිවි තොර කර ගත් පුවත ප්‍රමුඛතාවයෙන් යුතුව සඳහන් කිරීම, දිවි තොර කර ගත් අයගේ ඡායාරූප පළ කිරීම, උපකාරක අංක සඳහන් නොකිරීම වැනි මාධ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනයන් දක්නට ලැබේ.

දිවි තොර කර ගැනීම් වාර්තා කිරීමේදී, ඒ සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීම, වගකීම් සහගත මාධ්‍යකරණය බව Ethics Eye අපි නැවත නැවතත් පෙන්වා දී ඇත්තෙමු.

එසේ පැවසීමට හේතුව වන්නේ, ප්‍රවේසම් විරහිත දිවි තොර කර ගැනීම් වාර්තාකරණය, අනුකාරක සිදුවීම් වලට මඟ පෑදිය හැකි බැවිනි.

ඒ අනුව, දිවි තොර කර ගැනීම් නිසි ප්‍රවේසමකින් සහ ආචාර ධාර්මික ප්‍රවේශයකින් වාර්තා කිරීම, මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් බව ද අපි මෙසේම සඳහන් කරමු.

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)